843 අයි - රණේපුරගොඩ ග්‍රාම නිලධාරී වසමෙහි තොරතුරු

- **වසම පිළිබඳ හැඳින්වීම**

කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අතරින් ඌන ග්‍රාම නිලධාරී වසම් 60 න් එක් වසමකි. හෙක්ටයාර් 240.5 ක භූමි ප්‍රමාණයකින් යුක්තය. පවුල් 261 කින් යුක්තය. කඳුකර භූමියකින් යුක්ත මෙම වසමෙහි ජීවත් වන ජනතාව මිශ්‍ර භෝග වගාව තුලින් මෙන්ම ප්‍රධාන ජීවනෝපාය ලෙස වී ගොවිතැනෙහි නියැලෙති. මෙහි සුවිශේෂී කර්මාන්තය වන්නේ කිතුල් කර්මාන්තය යි.

- **වසමෙහි සිතියම හා පිහිටීම.**

උතුරින් :- 844 බෝතලාව වසම ද

දකුණින් :- 850 බී පැලවත්ත නැගෙනහිර වසම ද

බටහිරින් :- 844 ඊ කටුකැලේ වැල්මිගොඩ වසම ද

නැගෙනහිරින් :- 843 සී මණ්ඩගල වසම ද පිහිටීම මායිම් ලෙස දැක්විය හැකිය.

- **වසමට යන ගමන් මාර්ගය**

කළුතර නගරයේ සිට ගමන් මාර්ගය විස්තර කලහොත්, කලුතර ගාලු පාරේ කටුකුරුන්ද හන්දියෙන් වමට හැරී මතුගම පැමිණ, මතුගම අලුත්ගම මාර්ගයේ හොරවල හන්දියෙන් වමට හැරී මිගහතැන්න හරහා පැලවත්තට පැමිණිය හැකිය. පැලවත්තෙන් හෙවෙස්ස , බදුරලිය පාර් කි.මී.1 පමණ ගිය පසු රණේපුරගොඩ ග්‍රාම නිලධාරී වසමට ප්‍රවේශ විය හැකිය.

- **වසමට අයත් ගම් පිළිබඳ තොරතුරු**

රණේපුගොඩකෙත්හේන‍ෙ කාටසක්, ලියනවත්ත, කපුවැල්ල, ගමගොඩ, යන ගම් අයිති වේ. වසම අයත් කලාපය පැලවත්ත කලාපයයි. බල ප්‍රදේශය මිගහතැන්න වේ.

- **වසමේ නම සැදුණු ආකාරය**

16 වන සියවසේ මුල් භාගයේ දී පස්යොදුන් රට තාවකාලික රාජධානියක් කර ගනිමින් රණශූර විදිය බණ්ඩාර තම සංවිධාන ශක්තිය තරකර ගැනීමටත්, ආරක්ෂාවත් පතා පස්යොදුන් රට තෝරාගෙන ඇත. රණශූර විදිය බණ්ඩාර සැඟවී සිට ඇති බැවින් රණේපුරගොඩ නමින් හැඳින්වූ බව පැරණි ගැමියන් අතර ව්‍යවහාරයේ පවති.

- **වසම භූමියේ ස්වභාවය**

කඳු හා තැනිතලා සහිත භූමියකි. පස මැටි හැ වැලි බවින් යුක්තයි. ස්වභාවික සම්පත් මැණික් ලෙස හැඳින්විය හැකිය.

- **ජනගහනය**

ස්ත්‍රී	පුරුෂ
417	430

- **ආගම අනුව ජනගහනය**

ආගම	ස්ත්‍රී	පුරුෂ
බෞද්ධ	417	430

- **ජාතින් අනුව ජනගහනය**

ජාතිය	ස්ත්‍රී	පුරුෂ
සිංහල	417	430

- ආධාරලාභී පවුල් සංඛ්‍යාව :- 60
- වෙනත් ආධාරලාභී පවුල් සංඛ්‍යාව :- 13
- ආධාර ලැබිය යුතු එහෙත් නොලබන පවුල් සංඛ්‍යාව :- 43

- **ප්‍රදේශයේ ඇති විශේෂ දක්ෂතා ඇති කලාරුවෙකි,**

එස්.එච්.රූපසේන මහතා, රණේපුරගොඩ, පහල හෙවෙස්ස.

ඔහු දේශීය අමුද්‍රව්‍ය යොදා ගෙන විවිධ කලාත්මක නිර්මාණ කරන්නෙකි. එහිදී ඉතා ජනප්‍රිය නිර්මාණ ලෙස මඟුල් පුවරුල පිරිත් මණ්ඩපල පිලිගැනීමේ උත්සව නිර්මාණ සහ විවිධ නිර්මාණයන්හි කලාත්මක කලාකරුවෙකි.ඔහු විසින් නිමවන ලද ගොක් අතු භාවිතා කල නිර්මාණ රැසකි.





- ප්‍රදේශයේ ඇති පාරිසරික වශයෙන් සුන්දර ස්ථානයකි,

කළුගල දොළ

ප්‍රදේශයේ ජනතාවගේ මෙන්ම ඉපැරණිල ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථානයක් වන කළුගල ආරණ්‍ය සේනාසනය වැඳ පුදා ගන්නා බැතිමතුන්ගේ විඩාව නිවන ඉතා දැකුමිකළු ආකර්ෂණීය ස්ථානයකි.






- පොලිස් ස්ථාන :- නැත
- ආගමික ස්ථාන :- ශ්‍රී බෙත්තාරාම විහාරය, රණේපුරගොඩ
- දහම් පාසල :- ශ්‍රී බෙත්තාරාම දහම් පාසල
- අධ්‍යාපන තොරතුරු :-
    - රජයේ පාසල් :- 01
    - නම :- බප/මතු/රණේපුරගොඩ කණිෂ්ඨ විද්‍යාලය
- වැඩිහිටි නිවාස :- නැත
- ලියාපදිංචි නවාතැන් :- නැත
- සංරක්ෂිත ස්ථාන :- නැත
- ක්‍රියාත්මක වන කර්මාන්ත ශාලා :- නැත